## දමන ප්‍රාදේශීය සභාව
## අම්පාර දිස්ත්‍රික්කය

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2010 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2011 දෙසැම්බර් 31 දින වන විටත් විගණනයට ඉදිරිපත්කර නොතිබුණු අතර, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2011 ජූනි 24 දින ඉදිරිපත් කර තිබුණි.

**1.2 ගනුදෙනු , මෙහෙයුම් හා කාර්ය සාධන පිළිබඳ අදහස් දැක්වීම**

**1.2.1 බැංකු සැසඳුම්**

සභාවේ බැංකු ගිණුම් දෙකකට අදාලව 2010 ජනවාරි මාසයේ සිට 2010 දෙසැම්බර් මාසය දක්වා වූ බැංකු සැසඳුම් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

**1.2.2 විගණනය සඳහා සාක්ෂි නොවීම්.**

**පිළිතුරු නොලත් විගණන විමසුම්**

2009 හා 2010 වර්ෂයට අදාල විගණන විමසුම් 06 ක් සඳහා පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.

**1.2.3 අනුකූල නොවීම්**

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීතිරීති රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | |
| (i) 13 වන රීතිය | අයවැය ලේඛණයේ සහතික කළ පිටපතක් මුදල් වර්ෂය ආරම්භවීමට ප්‍රථම විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) 19 වන රීතිය | උප පත්‍රිකා පොත් සුරක්ෂිතව තබා නොගැනීම නිසා ලදුපත් පොත් 2 ක් අස්ථාන ගත වී තිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි | |
| (i) 103, 104 | සභාවට අයත් වාහනයේ 2009 නොවැම්බර් 17 දින සිදුවූ අනතුර සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| (ii) 751 | මිලට ගන්නා ලද ද්‍රව්‍ය තොග ලේඛනවල සටහන් කළ යුතු වුවත් ඇතැම් අවස්ථාවල දී එකී නියමයන් පැහැරහැර තිබුණි. |

| | |
|---|---|
| (iii) 139 (10) (i) | සියලුම ගෙවීම් පියවා ගැනීමට ප්‍රමාණවත් බැංකු ශේෂයක් පවතීද යන්න විමසීමකින් තොරව ගෙවීම් කිරීමට බලයලත් නිලධාරියා විසින් චෙක් පත් නිකුත් කිරීම හේතුවෙන් ලංකා බැංකු ජංගම ගිණුමේ මුදල් පොතේ ශේෂය අයිරාගැන්වී තිබුණි. |
| (iv) 396 | නිකුත් කළ මාස 06 ක කාලය ඉක්මවා ගෙවීම සඳහා ඉදිරිපත් නොවූ චෙක්පත් සම්බන්ධයෙන් රෙගුලාසි විධිවිධාන පරිදි කටයුතු කර නොතිබුණි. |
| (v) 756 | 2010 වර්ෂය වෙනුවෙන් ඉන්වෙන්ට්‍රි භාණ්ඩ සම්බන්ධයෙන් භාණ්ඩ සමීක්ෂණයක් පවත්වා නොතිබුණි. |

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 ආදායම් පරිපාලනය

#### 2.1.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට සහ ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම හා හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| | ඇස්තමේ -න්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය | ඇස්තමේ- න්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
| | රු. '000' | රු. '000' | රු. '000' | රු. '000' | රු. '000' | රු. '000' |
| (i) වරිපනම් හා බදු | 489.8 | 40 | 389.8 | 459.9 | 367 | 92.9 |
| (ii) බදු කුලී | 982.0 | 896 | 86.0 | 921.0 | 888 | 33.0 |
| (iii) බලපත්‍ර ගාස්තු | 672.0 | 672 | -- | 626.0 | 626 | -- |
| (iv) වෙනත් ආදායම් | 394.0 | 396 | -- | 249.0 | -- | 249.0 |

#### 2.1.2 මුද්දර ගාස්තු

2010 දෙසැම්බර් 31 දිනට රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් ලැබිය යුතු මුද්දර ගාස්තු වටිනාකම ඉදිරිපත්කර නොතිබුණි.

**2.2 වියදම් ව්‍යුහය**

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා සභාවේ අයවැයගත හා තථ්‍ය වියදම්, විචලනයන්ද සමග පහත දැක්වේ.

| | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| වියදම් විෂයය | අයවැයගත | තථ්‍ය | විචලනය | අයවැයගත | තථ්‍ය | විචලනය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| | '000' | '000' | '000' | '000' | '000' | '000' |
| **පුනරාවර්තන වියදම්** | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 8,418 | 8,012 | 406 | 18,101 | 6,901 | 11,200 |
| අනෙකුත් | 2,678 | 2,275 | 403 | 2,280 | 2,280 | -- |
| උප එකතුව | 11,096 | 10,287 | 809 | 20,381 | 9,181 | 11,200 |
| ප්‍රාග්ධන වියදම් | 400 | 31,050 | (30,650) | 675 | 675 | -- |
| **මුළු එකතුව** | **11,496** | **41,337** | **(29,841)** | **21,056** | **9,856** | **11,200** |

**2.3 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

සභාවේ අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| සේවක ශ්‍රේණිය | 2010දෙසැම්බර් 31 දිනට | |
|---|---|---|
| | අනුමත | තථ්‍ය |
| මාණ්ඩලික | 01 | - |
| ද්විතීයික | 12 | 07 |
| ප්‍රාථමික | 26 | 17 |
| වෙනත් (අනියම්, තාවකාලික) | - | 07 |
| | 39 | 31 |

**2.4 වත්කම් කළමනාකරණය**

**2.4.1 නිශ්කාර්ය /ඌණ උපයෝජිත සම්පත්**

වටිනාකම ගණනය කර නොතිබූ ට්‍රැක්ටරයක් හා ට්‍රේලරයක් වර්ෂ හතරකට අධික කාලයක් තිස්සේ නිශ්කාර්යව පැවතුණි

**2.4.2 අයවීමට ඇති සේවක ණය**

2009 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා අයවීම් හිඟහිටි සේවක ණය අත්තිකාරම් ශේෂවල එකතුව රු. 19,420 ක් විය.

**2.5 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

(අ) චෙක්පත් වලින් ගණුදෙනු කිරීමේ දී ආදායකයාගේ නමට චෙක්පත් ලිවීම වෙනුවට රු.412,200 ක මුදල් චෙක්පත් ලියා තිබුණි.

(ආ) දේශීය ණය සහ සංවර්ධන අරමුදලෙන් 2003 ජූලි 07 දින සති පොළ සංවර්ධනය සඳහා ලබාගත් රු.1,150,000 ද, 2007 නොවැම්බර් 16 දින යතුරු පැදි මිළදී ගැනීම සඳහා ලබාගත් රු.800, 000 ක ද ණය මුදල ගිවිසුම් ප්‍රකාරව ගෙවීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2009 වර්ෂයේ පෙබරවාරි, අප්‍රේල්, ජූනි, අගෝස්තු, සැප්තැම්බර්, ඔක්තෝබර්, නොවැම්බර්, මාසයන්හිදී වැටුප් අවකරණ සඳහා ලියා තිබූ රු.188,604 ක් වටිනා චෙක්පත් 2009 දෙසැම්බර් 31 දින දක්වාම අදාල ආයතනවලට යවා නොතිබුණි.

2.6 **<u>අභ්‍යන්තර විගණනය</u>**

ආයතන තුල ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

3. **<u>පද්ධති හා පාලන</u>**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානයක් යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය

(ආ) මූල්‍ය පාලනය